## ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
## රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 29 දින කැබ්රථය සඳහා රු. 60,000 ක් වැයකර ඇලෝවීල් 04 ක් මිලදී ගෙන ඇති අතර, මෙම වටිනාකම ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට ගණනය කර නොතිබූ 2012 වර්ෂයට අදාල වූ ණයහිමි ඌන වෙන්කිරීම් ලෙස හඳුනා ගෙන ඇති වියදම් වර්ග 13 කට අදාල එකතුව රු. 556,273 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු සහ උසාවි දඩ නිවැරදි ආදායම් ප්‍රමාණය උප ලේඛන මඟින් තහවුරු කරගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල පලාත් සභා කර්මාන්ත ලැබීම් රු. 4,206,908 ක් සහ පලාත් සභා කර්මාන්ත ගෙවීම් රු. 4,628,263 ක වටිනාකම අයවැයගත කර ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වාණිජ ව්‍යාපෘති ගිණුම සඳහා වෙනම වැඩසටහන් හඳුන්වා දී වාර්ෂික අයවැයෙහි ප්‍රතිපාදන සලසා නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ වාණිජ ව්‍යාපෘතියට අදාල රු. 3,350,304 ක ආදායම් සහ රු. 3,351,609 ක වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳු ගිණුම්

දේශිය ණය හා සංවර්ධන අරමුදල් ණය පාලන ගිණුම් අනුව ශේෂය රු. 6,924,782 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 8,593,880 ක් වූයෙන් රු. 1,669,098 ක වෙනසක් නිරික්ෂණය විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්න වියදම ඉක්ම වූ ආදායම රු. 6,727,944 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,855,822 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 2,990 | 2,695 | 295 |
| (ii.) | බදු කුලී | 6,468 | 5,680 | 787 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 529 | 684 | (105) |
| (iv.) | වෙනත් ආදායම් | 5,515 | 8,543 | (3,029) |

2.2.2 වෙනත් ආදායම්

රක්වාන පැරණි වෙළඳ සංකීර්ණයේ අංක 12 දරන කඩ කාමරය සඳහා 2007 පෙබරවාරි සිට හිඟ කඩ කුලී රු. 8,500 ක්ද, 2006 ජනවාරි සිට විදුලි ගාස්තු රු. 15,242 ක් ද, වශයෙන් එකතුව රු. 23,742 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 2,117,006 |
| (ii.) | මුද්දර ගාස්තු | 1,619,125 |

2.4 මෙහෙයුම් අකර්යක්ෂමතා

(අ) මාස 09 සිට වසර 01 මාස 11 දක්වා කාලයක් ගතවූ එකතුව රු. 202,697 ක් වූ අත්තිකාරම් ප්‍රමාණයක් විගණන දිනය වූ 2013 ජූලි 11 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් සහ සේවය අත්හිටුවීම හේතු කොටගෙන 2013 ජූලි 09 දිනට නිළධාරීන් සහ සේවකයින් 05 දෙනෙකුගෙන් සේවක ණය රු. 170,622 ක් අයවීම හිඟහිට තිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය